# නිදහස් අරගලයේ ආරම්භය සහ ව්‍යාප්තිය

ආචාර්ය අජිත් තල්වත්ත, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
මානව ශාස්ත්‍ර අධ්‍යනාංශය, සාමාජීය විද්‍යා සහ මානව ශාස්ත්‍ර පීඨය,
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය,

දාසයවන සියවසේ සිට බටහිර යටත්විජිත පාලනයට නතුවූව ද ඊට එරෙහිව විටින් විට යටත්විජිත විරෝධී ව්‍යාපාර දක්නට ලැබුණි. ශ්‍රී ලංකාව පිළිවෙලින් පෘතුගීසි, ලන්දේසි සහ ඉංග්‍රීසි යන යුරෝපීය ජාතින්ගේ ග්‍රහණයට ලක් වී තිබෙන අතර ඉන් වැඩිම බලපෑම සිදු කිරීමට බ්‍රිතාන්‍යයන් සමත් වී ඇත. පෙරදිග ඉන්දීය වෙළඳ සමාගම 1796 දිවයිනට පැමිණ, ක්‍රමිකව තම ආධිපත්‍ය ස්ථාවර තබාගැනීමට කටයුතු කළේ ය. විවිධ ක්‍රමෝපායන් ඇසුරෙන් තම බලය ගොඩනගා ගන්නා ඔවුන්, 1815 වනවිට දිවයිනේ ම රාෂ්ටමය පාලකයන් ලෙස බලය දිනා ගැනීමට සමත් විය. තම යටත්විජිත අපෙක්ෂා ඉටුකරගැනීමට ක්‍රියාත්මක කළ දේශපාලන, සමාජ සහ ආර්ථික ප්‍රතිපත්තීන් දේශීය සමාජයේ අතෘප්තියට සෘජුව බලපෑවේ ය. එහි ආසන්නත ම සිදුවීම වූයේ 1818 දී ඉංග්‍රිසීන්ට එරෙහිව ප්‍රථම විමුක්ති සටන් ව්‍යාපාරය ආරම්භ වීමය. මෙම අධ්‍යයනයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ ක්‍රි.ව.1818 විමුක්ති අරගලය ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා ය.

වර්ෂ 1815 මාර්තු 02 දින ස්වකීය අභිමානය ඉංග්‍රීසීන් වෙත පවරාදුන් උඩරැටියාට නොබෝ දිනකින් අසහනකාරී ගැටලු රැසකට මුහුණ පෑමට සිදුවිය.[33] එමනිසා ඔවුන් ඔවුන් උද්ගතවෙමින් පැවති තත්ත්වයෙන් මිදීමට අවශ්‍ය පියවර ගත්ත ද සියල්ල අසාර්ථක විය. බ්‍රිතාන්‍යයන් කූට උපක්‍රම යොදා ආධිපත්‍යය ස්ථාපිත කරගැනීමට උත්සහ ගත්ත ද දේශීයන් කෙරෙහි එතරම් අවධානයක් යොමු කළේ නැත. 1818 කැරැල්ල පැන නැගීමට පෙර උඩරට ප්‍රදේශවල සිදු වූ බ්‍රිතාන්‍ය විරෝධි කුමන්ත්‍රණ මගින් පැහැදිලිව පෙන්නුම් කරන්නේ දීර්ඝ කාලයක් තිස්සේ සිට ම බ්‍රිතාන්‍යයන් විසින් ඇති කළ ක්‍රමයට විරෝධය පැවති බවයි. **ඉහගම සහ**

---

[33] තල්වත්ත, අජිත් **කන්ද උඩරට රාජධානිය සහ 1818 කැරැල්ල,** ආරිය ප්‍රකාශකයෝ, වරකාපොල, 2009, **56** පිට.

**පොල්වත්ත නම් භික්ෂූන් දෙනමත් මඩුගල්ලේ උඩ ගබඩා නිලමේත් 1816 දී බ්‍රිතාන්‍ය විරෝධී කුමන්ත්‍රණයට වරදකරුවෝ වූහ.**[34] විශේෂයෙන්ම මෙහි දී දක්නට ලැබෙන්නේ මුලින් ම භික්ෂූන්ගේ මැදිහත් වීමයි. බුදු දහමත් බෞද්ධ ශාසනයත් අනතුරේ බව මේ අවධියේ ම පැන නැගුණු ප්‍රධාන සටන් පාඨයක් විය. එබැවින් ශාසනයේ චිරාත් කාලීන පැවැත්ම වෙනුවෙන් නැවතත් දේශිය නායකයෙකු රාජ්‍යත්වයට පත් කිරීම සමකාලීන භික්ෂු සමාජයේ වගකීමක් සේ සැලකූ බව මෙයින් පෙන්නුම් කරයි. පන්සල් සතු දේපොළ සහ අනෙකුත් වරප්‍රසාද සුරැකීමට ගිවිසුමෙන් බැඳී සිටිය ද ක්‍රිස්තියානි ආගම උඩ රට ප්‍රදේශයේ ද ව්‍යාප්ත කිරීම බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී ව්‍යාපෘතියේ එක් ප්‍රධාන ඉලක්කයක් විය. ඒ පිළිබඳව උඩරට සිටි ඉංග්‍රීසි පාලකයෝ නොමසුරු උත්සාහයක් ගත් අතර එය බ්‍රිතාන්‍යයට ද සැල කර සිටියෝය. එපමණක් නොව, උඩරට රදල සමාජයට එතෙක් හිමිව පැවති ස්ථානය පිළිබඳ ගැටලු රැසක් ඇතිවී තිබිණි. මෙරට සාමාන්‍ය ජනතාවට ද බොහෝ ප්‍රශ්න රැසකට මුහුණ පෑමට සිදු විය. ඉහත කී පසුබිම යටතේ රදලවරු, ජාතිහිතෛෂී භික්ෂූන් වහන්සේ සහ ග්‍රාමීය ජනවතාව මහත් අසහනයට පත්වූහ.[35] ඉංග්‍රීසීන්ට එරෙහිව ගෙන යන අරගලයේ දී මුළු සිංහල ජාතියම ඒ සඳහා සහභාගී විය යුතු බව සිංහල නායකයෝ දැඩි ලෙස පිළිගත්හ.[36]

වර්තමානයේ ජීවත්වන අප පරගැති චින්තනයට අනුව කටයුතු කරන ජාතියකි. එනමුත් ඉතිහාසය පුරාම සිංහල බෞද්ධ අප ජීවත් වූයේ නිවහල්, නිදහස් ජාතියක් විලසිනි. 1818 කැරැල්ල තුළින් අපෙක්ෂා කරන්නේ ද ගිලිහී ගිය එම ගෞරවාන්විත සිංහල බෞද්ධ සංස්කෘතිය ස්ථාපිත කරගැනීම සඳහා ය. මෙම සියලු දේ ඇසුරෙන් පෙන්නුම් කළේ නිදහස් අරගලයකට සුදුසු වාතාවරණය මැනවින් ගොඩනැගී තිබුණු බවයි. තවදුරටත් නිවට නියාලුව සිටීමේ පලක් නොමැති බව අවබෝධ කරගත් උඩරැටියා වහවහා සංවිධාන ගත විය. අරගලයක් ඇතිවීමට යම් පසුබිමක් නිර්මාණය වේ. ඒ සඳහා පෙරමුණ ගන්නේ ජාතිහිතෛෂී විරුවන්ය. පීඩනය පිටව යාමට නම් යම් ආරම්භයක් තිබිය යුතුය. නිදහස් අරගලයට

---

34 එම, 129 පිට.
35 වල්පොළ, රාහුල, **භික්ෂුවගේ උරුමය**, එස්. ගොඩගේ සහෝදරයෝ, කොළඹ, 1992, 51 පිට.
36 විමලරත්න, කේ.ඩී.පී. **ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය ආධිපත්‍ය 1796 -1948**, රත්න ප්‍රකාශකයෝ, කොළඹ, 1992, 87 පිට.

එකිනෙකා අතර රහසේ අදහස් හුවමාරු වූවත් **ඒ සඳහා පුරෝගාමී වන්නේ හැපලෝගම මොහොට්ටාල විසිනි.** වෙල්ලස්සෙන් දියත් කළ නොසන්සුන්තාවය බ්‍රිතාන්‍ය විරෝධී අරගලයක් බවට පත් වූයේ උඩරට සිහසුන සඳහා උරුමකරුවෙකු ඉදිරිපත්වීමත් සමඟ ය.[37] මෙරට උරුමයේ සුරක්ෂිතභාවයට **එදා සිට අද දක්වාම භික්ෂූන් වහන්සේලා සුවිශාල කාර්ය භාරයක් ඉටුකරමින් සිටී.** එහෙත් උන්වහන්සේලාට අද හිමි ස්ථානය පිළිබඳ ගැටලු පවතී. මෙම අවස්ථාවේ දී ද ඉදිරියට ආවේ ද භක්ෂූන් වහන්සේලා ය. වර්ෂ 1817 සැප්තැම්බර් මාසයේ භික්ෂූන් කිහිපනමක් පිරිවරා ආ නායක හාමුදුරු කෙනෙක් කතරගම දේවාලය වැඳපුදාගෙන උඩරට රාජ්‍ය කතරගම දෙවියන් විසින් තමාහට පවරාදෙන ලදැයි ප්‍රකාශ කර ඇත. දුටුගැමුණු රජතුමා ද එළාරට එරෙහි සටනේ දී කතරගම දෙවියන්ගේ ආශීර්වාදය මැද සටන ජයක්ග්‍රහණය සඳහා මෙහෙයවීම ප්‍රකට කරුණකි. කතරගමින් යුද්ධය ජයක්ග්‍රහණය කිරීමට ලැබෙන පිහිට අතිමහත් ය. මෙසේ පැමිණි උන්වහන්සේ එහිදී උපැවිදි වී, කීර්ති ශ්‍රී රාජසිංහගේ බිසවගේ සොහොයුරා වූ කළු නායක්කර්ගේ පුත් දොරේ සාමි බවත් ''වීරවික්‍රම ශ්‍රී කීර්ති'' යන අභිෂේක නාමයෙන් උඩරට රජු වන බවද ප්‍රකාශ කළේ ය.[38] මොහු ''මලබාරයෙන් පැමිණි අමුත්තා'' ලෙසත් ජනතාව අතර ප්‍රචලිත විය.[39] අභිෂේකයෙන් පසු දොරේසාමිගේ සහයට සිටියේ බින්තැන්නේ සහ වෙල්ලස්සේ වැදි ජනතාව පමණි. එතැන් සිට සෙසු ජනතාව ද මෙම අරගලය වටා ඒකරාශී වූහ.

බ්‍රිතාන්‍ය පාලනය තුරන් කිරීමේ අරමුණින් සිදුකළ අභිෂේකයේ තොරතුරු දැනගත් ඉංග්‍රීසීන් වඩාත් කලබලයට පත්ව ඇත. උද්ගත වෙමින් පැවති තත්ත්වය විනාශ

[37] අබේසිංහ, ටිකිරි, දේවරාජ, ශ්‍රීමති, සෝමරත්න, පී.පී.වී. **උඩරට රාජධානිය 1470-1818**,ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්ස්,

කොළඹ, 1977,145 පිට.

[38] ඉලංගසිංහ, මංගල, **රාජ්‍ය සහ ආගම**, කැලණිය විශ්වවිද්‍යාලය, මොරටුව, 1965, 96 පිට.
[39] දේවරාජ, ලෝනා, ශ්‍රීමතී, **උඩරට රාජධානිය**, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, පාදුක්ක, 1997, 132 පිට.

කිරීමට නම් මලබාර් අමුත්තා අනිවාර්යයෙන් ම සිරභාරයට ගැනීම අනිවාර්ය බව බ්‍රිතාන්‍යයන් අවබෝධ කර ගත්තේ ය.[40] එම වගකීම පැවරුනේ හජ්ජි මුහන්දිරම්ට ය. ඔහු දොරේසාමි ඇල්ලීමට සේනාව සමඟ පිටත් වුවත් සිංහල විරුවන්ට මුහුණදීමට තරම් ශක්තියක් නොවූ හෙයින් පලා ගොස් ඇත. පළමු ප්‍රයත්නය අසාර්ථක වූ බැවින් මලබාර් අමුත්තා ඇල්ලීමට බදුල්ලේ දිසාපති වූ විල්සන් ප්‍රමුඛ ලුතිනන් නිව්ටන් යටතේ භට හමුදාවක් ඌව බලා පිටත්ව ගියහ. නමුත් ඉනාමලුව ප්‍රදේශයේ කැරලි කරුවන් නොසිටි නිසා බින්තැන්න බලා ගමන් ආරම්භ කළහ. බූටාවේ රටේරාල ළඟ හජ්ජි මුහන්දිරම් සිර කර සිටින බව දැනගත් විල්සන්, බින්තැන්න බලා පිටත් වී ඇත. නමුත් හජ්ජි මරික්කාර් හා විල්සන් යන දෙදෙනාම ඝාතනය කිරීමට කැරලි කරුවන්ට හැකි විය. ඉංග්‍රීසි ආණ්ඩුව මෙවැනි තත්ත්වයක් අපෙක්ෂා කළේ නැත. තවද ඒමගින් ඔවුන් ඉමහත් මහත් කලබලයට පත් වූ බව පෙනේ. පෙළ ගැසෙමින් සිට සිහංල සේනාව රොබට් බ්‍රවුන්රිග් හැඳින්වූයේ වැද්දන් හෙවත් වනචාරීන් වශයෙනි.[41] ඒමගින් මෙම අරගලය සම්බන්ධ බ්‍රිතාන්‍ය ආකල්පය කුමක් ද යන්න වටහා ගත හැකි ය. මෙය මුල් මාස හතර සහ පහ තුළ දී ඌවට පමණක් සීමා වූ බවක් පෙනේ. එනමුත් මෙම ව්‍යාපාරය උඩරට සෙසු පළාත්වල ද පැතිර යාම වැළැක්වීමට ඉංග්‍රීසීන් ගනු ලැබූ සියලු ප්‍රයත්න අසාර්ථ විය.[42]

ඌවේ නොසන්සුන්කම ඉක්මනින් පාලනය කිරීමට බ්‍රිතාන්‍ය හමුදා අපොහොසත් වීම නිසා නොසන්සුන් වාතාවරණය තදින් ව්‍යාප්තවීමට බලපෑවේ ය. තම අභිමථාර්ත සාධනය කරගැනීම සඳහා සිංහලයා පෙළ ගැසුනහ. ඒ සමඟ ම සෙසු ප්‍රදේශවල නායකයින් හා මහජනයා ද කැරැල්ලට එක් වූහ. 1818 පෙබරවාරි වන විට මෙම අරගලය බොහෝ ප්‍රදේශ ඇසුරෙන් ව්‍යාප්තවීම ශීඝ්‍රයෙන් සිදුවිය. ඒ අනුව මෙම අරගලය දුම්බර, හේවාහැට, හත් කෝරළේ, හාරිස්පත්තුව, මාතලේ සබරගමුව, නුවරකලාවිය යන ප්‍රදේශවල ද තදින් පැතිර ගියේය. මෙහි පැවති විශේෂත්වයක් වූයේ ඒ ඒ ප්‍රදේශවල නායකයින් වටා ජනතාව ඒකරාශී වූහ. උඩරට

---

40 තෙන්නකෝන්, විමලානන්ද, **උඩරට මහා කැරැල්ල**, කාණ්ඩ 111, ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, කොළඹ,1962,123 පිට.

41 ගුණවර්ධන, ඩබ්ලියු. කේ. පී. **සිංහලේ නිදහස් සටන**, ස්පාටන් මුද්‍රණ, නුගේගොඩ, 1939, 45, පිට.

42 එම.

සිංහල ජන ප්‍රධානීන්ට ශක්තිමත් ජනපදනමක් තිබුණි. මඩුගල්ලේ උඩ ගබඩාවේ නිළමේ දුම්බර හා තුම්පනේ ප්‍රදේශවලට නායකත්වය ලබා දුන්නේ ය. පිළිමතලව්වේ කැරැල්ලට එක්වීම නිසා හත් කෝරළය ප්‍රදේශය ඇසුරෙන් ද ජනතා නැගී සිටීම වේගවත් විය. මෙම අරගලය ව්‍යාප්ත නොවුනේ උඩුනුවර, යටිනුවර, හත් කෝරළේ හා සබරගමුවේ කොටසක් තුළ පමණි. පැවති වාතාවරණය පාලනය කිරීමට ඉංග්‍රීසීන් කඩිනම් ක්‍රියාමාර්ග ගතයුතු බවට අවබෝධ කරගත්තේ ය. රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා උද්ගතවූ තත්ත්වය මර්දනය කිරීමට වහා පියවර ගත්තේ ය. වෙල්ලස්ස හා බින්තැන්න දිසාව, ඌව දිසාව සහ වලපනේ දිසාව යන තිදෙනා ස්වකීය දිසාවන්ට ගොස් උද්ගතව ඇති නොසන්සුන්කාරී තත්ත්වය මර්දනය කරන ලෙස ආණ්ඩුකාරවරයා නියෝග කළේ ය. ඒ අනුව තුවක්කුව සහ කඩුව රැගත් බ්‍රිතාන්‍ය යුද සෙබලුන් සිංහල සංහාරය ආරම්භ කිරීමට පියවර ගන්නා ලදී. 1817 සැප්තැම්බර් 18 වන විට ලුතිනන් පේලී යටතේ බින්තැන්නටත් 1817 සැප්තැම්බර් 21 දින ලුතිනන් ප්‍රේටිස් සහ කපිතාන් ප්‍රේසර යටතේ තවත් සේනාංකයක් වෙල්ලස්සටත් ගියහ. **මෙම අරගලයේ තීරණාත්මක නායෙකයෙකු ලෙස ප්‍රමාදව හෝ පැමිණි මොනරවිල කැප්පෙටිපොළ බදුල්ල බලා ගමන් කළේ ය.** මෙම ගමන තුළින් ස්වකීය ජීවිතය මාතෘ භූමියේ ස්වාධීනත්වය වෙනුවෙන් කැපකර, ඉතිහාසයේ නොමැකෙන විරුවෙකු වෙතැයි කිසිදා මොනරවිල කැප්පෙටිපොළ නොසිතන්නට ඇත. කන්ද උඩරට බලය අල්ලා ගැනීමේ මහා මොළකරු වන ජෝන් ඩොයිලි යටතේ ද සේනාවක් හඟුරන්කෙත හරහා බදුල්ලට පිටත් වුණි. මඩකලපුවෙන් හා ත්‍රිකුණාමලයෙන් ද අතිරේක සේනා පැමිණියහ. මේ ආකාරයට විශාල පිරිසක් අරගලය මර්දනය කිරීමට සන්නද්ධ වූ බව පෙනේ.

මොනරවිල කැප්පෙටිපොළ දිසාවගේ සේවය පිළිබඳ දැඩි විශ්වාසයක් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී පාලකයන් තුළ ගොඩනැගී තිබුණි. තමාට පැවැරෙන රාජකාරිය නිසි අයුරින් ඉටුකරන බව ද ඔවුන් මැනවින් අවබෝධ කර ගත්තේ ය. තවද හෙතෙම ජනතාව අතර ජනප්‍රිය නායකයෙක් විය. ඔහුට විශාල ජනපදනමක් තිබුණි. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු යටතේ ඌවේ දිසාවෙ තනතුර දැරූ කැප්පෙටිපොළ නිළමේවරයා 1815 උඩරට ගිවිසුම අත්සන් කළ ප්‍රධාන පෙළේ නිළමේවරුන් අතර

සිවුවැන්නා විය. එම ගිවිසුමට සම්පූර්ණයෙන් ම සිංහල අක්ෂරවලින් අත්සන් තැබූ තිදෙනා අතරට ද කැප්පෙටිපොළ දිසාවේවරයා ඇතුළත් වී ඇත. 1815 ගිවිසුම් පිටපත කියවූ මාර්තු 03 වෙනි දින පත්කිරීම් කිහිපයක් සිදුකළ අතර ඒ අවස්ථාවේ දී කැප්පෙටිපොළ නිළමේවරයා ඔහු දරමින් සිටි ඌවෙ දිසාවේ තනතුරට පත්කරනු ලැබී ය. ඒ අනුව ඉංග්‍රීසීන් තුළ ඔහු කෙරෙහි කිසිදු අවිශ්වාසයක් නොතිබූ බව පැහැදිලි විය. කැප්පෙටිපොළ නිළමේවරයා ඉංග්‍රීසි ආණ්ඩුව සමඟ ඉතා සමීපව පරිපාලන කටයුතුවල නියැළුණු අතර 1816 දී සිදුවූ ඉහගම කුමන්ත්‍රණයට ඔහු සම්බන්ධ බවට තොරතුරු ලැබිණි. එහෙත් ඒ කිසිවක් සනාථ නොවීය. ඒ අතර කුමන්ත්‍රණය ගැන පරීක්ෂණ පැවැත්වූ අවස්ථාවේ මතු වූ තවත් එක් ගැටලුවක් පිළිබඳ තොරතුරු සෙවීමේ කාර්යභාර්ය පැවරිය යුතු විශ්වාසනීය පුද්ගලයෙක් වශයෙන් ද ඔවුන් කැප්පෙටිපොළ දිසාවේවරයා තෝරා ගත්හ. ඒ අනුව ඌව වෙල්ලස්ස ප්‍රදේශවල උද්ගත වීතිබූ තත්ත්වය යටතේ කලබල මැඩලීම සඳහා යැවිය යුතු වඩාත් සුදුසුම පුද්ගලයා ලෙස ජනතාව විසින් බෙහෙවින් ආදරය කළාවූ ද ඉංග්‍රීසීන්ගේ විශ්වාසය දිනා සිටියාවූ ද ඌවේ දිසාවේවරයා වූ මොනරවිල කැප්පෙටිපොළ තෝරා ගැනිණ. ඔහු ආරක්ෂක භටයන් දොළොස් දෙනෙකු සමඟ කලබල පැවති ප්‍රදේශයට යැවීය. එහෙත් අලුපොත දී ඔහු සටන්කාමීන්ගේ අත්අඩංගුවට පත්වූ බව 1818 නොවැම්බර් 02 වෙනි දින බදුල්ලේ ඒජන්තවරයා විසින් ඩොයිලිට දන්වා එවා තිබිණි. කැප්පෙටිපොළ දිසාවේවරයා තමා සමඟ පැමිණි ඉංග්‍රීසීන්ගේ ආරක්ෂකයන් ද ආපසු යැවූ අතර ඔහු සටන්කරුවන්ගේ අත්අඩංගුවට පත්වූ බවක් හැඟවූ නමුත් ඇත්තවශයෙන් ඔහු සටන්කරුවන් සමඟ කුමන්ත්‍රණය කරමින් සිටි බවද ඔහු සිතාමතා ම ඔවුන්ට එකතු වූ බවද ඇතැම් අය විසින් අනුමාන කරනු ලැබී ය. ඉංග්‍රීසීන් අපෙක්ෂිත පරමාර්ථ බිඳ වැටුනේ කැප්පෙටිපොළ කැරලිකරුවන් හා එක්වී කටයුතු කිරීමත් සමඟ ය.[43] මෙරට රාජ්‍යත්වයට යම් අයෙක් පත්වන්නේ ද ඔහු සතුව දළදාව පැවතීම අනිවාර්ය බවට පුරාතනයේ සිට පැවත සම්ප්‍රදාය සහ විශ්වාසය විය. එය වර්තමානයේ ද එලෙසම පවතින අදහසකි. මෙම අරගලය අවස්ථාවේ ද එම මතය ප්‍රායෝගික යථාර්ථයක් වූයේ කැරලිකරුවන් දළදා

---

[43] ද සිල්වා, කොල්වින්, ආර්. **බ්‍රිතාන්‍යයන් යටතේ පැවති ලංකාව,** කොළඹ, 1958, 152 පිට.

වහන්සේ තමන් සතු කරගැනීමත් සමඟ ය. අරත්තන දී සිදු වූ ඓතිහාසික සිදුවීම බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය පාලනයට එරෙහිව පෙළ ගැසීමේ තීරණාත්මක අවස්ථාවකි. කැප්පෙටිපොළ අරගලයට සම්බන්ධවීම නිසා සෙසු පිරිස් වෙත මහත් අත්වැසිල්ලක් ගෙනදුණි. මෙහි දී හඟුරන්කෙත ඩිංගිරාලට පැවරුණු වගකීම වූයේ අරගලයට ප්‍රමාණවත් සේනාව රැස් කිරීමයි. කැප්පෙටිපොළගේ පුනරාගමනයත් සමඟ කැරැල්ලට සහභාගී වූ සෙසු නායකයින් සහ ජනතාව අතර විශාල ප්‍රබෝධයක් ඇති වූහ. එකිනෙකා රහසිගතව අවශ්‍ය සබඳතා පවත්වාගෙන ගියේය. ඉංග්‍රීසීන්ට හිතවත්ව මොල්ලිගොඩ ක්‍රියා කළත් **මඩුගල්ලේ, මිල්ලෑව සහ කොබ්බෑකඩුවේ යන නායකයන් අරගලයට අවශ්‍ය ශක්තිය ලබා දුනි.**[44]

මෙම අවස්ථාවේ දී පැවති සියලු සාධක සිංහලයන්ට මහත් වාසිදායක තත්ත්වයක් ගෙන දුන්නේ ය. ඒ වන විට ලංකාවේ ඉංග්‍රීසි සේනාව සිටියේ ස්වල්පයකි. යුද උපකරණ සහ භාණ්ඩ සැපයීමට ප්‍රමාණවත් පරිදි අතවැසි සේනාවක් ද නොවීය. දේශගුණික වශයෙන් ගංගා ඇළ දොළ පිටාර ගැනීමත් සමඟ කොළඹ සහ මහනුවර අතර සියලු සබඳතා අඩාල විය.[45] කැප්පෙටිපොළ කැරලිකරුවන්ට එක්වීම ද බෙහෙවින් අවාසිදායක විය. මෙම හේතු නිසා කැරැල්ල සංවිධානාත්මක ලෙස ව්‍යාප්තවීම නිසා ප්‍රශ්නය සංකීර්ණ වෙතැයි රොබට් බ්‍රවුන්රිග් තුළ දැඩි බියක් හටගත්තේ ය. 1817 නොවැම්බර් මස 01 වන දින විට ඌව දිසාවේ බලය ඇල්ලීම තීරණාත්මක සාධකයක් විය. තම පසුබෑසීම වළකා ගැනීමට නම් අතිරේක සේනා ලබාගැනීම ඉංග්‍රීසීන්ට අත්‍යවශය විය. ආණ්ඩුකාරවරයාගේ ඉල්ලීම පරිදි බෙංගාලයෙන් සහ මදුරාසියෙන් ආධාරක සේනා පැමිණියහ. 1818 ජූලි මාසයේ දී හේවායින් 5200ක් පමණ කැරලි කරුවන්ට විරුද්ධව මෙහෙය වීමට ආණ්ඩුකාරවරයාට හැකි විය. වෙල්ලස්සට සේනාංක පැමිණෙන විට ජනතාව කැලෑ වැදුනහ. කාර්යක්ෂමව සන්නිවේදනයක් ඇති කිරීමේ අරමුණින් කොටබෝව නම් මුස්ලිම් ග්‍රාමයේ ප්‍රධාන මධ්‍යස්ථානයක් ආරම්භ කළේය. වඩා ශක්තිමත්ව පැමිණි බ්‍රිතාන්‍යයෝ සරුසාර ගම් බිම් විනාශ කර සාමාන්‍ය ජනතාව අසරණභාවයට පත් කළහ. එසේ විනාශයට ලක් වූ ගම් අතර උස්නවැල්ල ප්‍රධාන

---

[44] තල්වත්ත, 2009, 65 පිට.

[45] කොඩ්රින්ටන්, එච්. ඩබ්ලියු. සංක්‍ෂප්ත ලංකා ඉතිහාසය, ලංකාණ්ඩු මුද්‍රණාලය, කොළඹ, 162 පිට.

වේ. ගම්මානය ගිනිබත් කොට ගවයන් රංචු පිටින් පුළුස්සා ආහාර ලෙස ගැනීමට හේවායින් මිලේච්ඡ වූහ. ඉංග්‍රීසීන් බොහෝ යටත්වජිතවල තම ආධිපත්‍ය ස්ථාපිත තරගැනීමේ දී මෙවෙනි සාහසික ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත. ඔවුන් රැ මුරකරුවාගේ න්‍යාය තුළ යටත්විජිත සමාජ ආරක්ෂා කළ බවට පවතින මතය මෙමගින් මිත්‍යාවක් වූ බව පෙනේ. මෙම පහත් සිදුවීම් මගින් සිංහලයා තව තවත් අධිෂ්ඨානයෙන් යුතුව සටනට සැරසුනහ. 1818 නොවැම්බර් 21 වන විට බදුල්ලේ බලය ද සිංහලයන් නතු කරගත්හ. **කැප්පෙටිපොළගේ නායකත්වය යටතේ බදුල්ලට ලගාවිය හැකි සෑම මාර්ගයක්ම කැරලිකරුවන්ගේ පාලනයට නතු වූහ.** සැපයුම් මාර්ග සීමා කිරීමත් සමඟ ඉංග්‍රීසීන් අසරණ භාවයට පැමිණියහ.[46]

පාලකයෙකු සිටිම සහ අභිෂේක ලැබීම වැසියන්ගේ ප්‍රීතියට සහ චිත්ත ධෛර්ය වර්ධනයට සෘජුව බලපානු ලබයි. ඒ අනුව ලැබූ ජයග්‍රහණවලින් උද්දාමයට පත්වූ සිංහල සේනාව නැවත අභිෂේක උත්සවයක අවශ්‍යතාවය දැනුණි. එමගින් ජනතාව වෙත ප්‍රබල පණිවිඩයක් ලබාදීමේ හැකියාව ඇති බව අරගලයට එක්වූවන් අවබෝධ කරගත්තේ ය. රාජ්‍යත්වයට උරුමකම් කී දොරේසාමිගේ අභිෂේක ගැන්වීමේ උත්සවය වෙල්ලස්සේ, දියබෙත්මේ අලුත්වල නම් ග්‍රාමයේ පැවැත්වීමට යොදාගෙන ඇත. මෙම උත්සවය ද පෙර ක්‍රමයට අනුව යමින් සියල්ල සංවිධානය විය. අභිෂේකයට අවශ්‍ය මාළිගයක් සහ මඟුල් මඩුවක් යනාදී දෑ ඉදිකිරීමේ වගකීම් කැප්පෙටිපොළ නිලිමේතුමාට භාරවිය. සියලු කටයුතු සම්පාදනය කර සෑම දිසාවක් ම භාර සිංහල නායකයෝ ස්වකීය දිසාවට අයත් කොඩිය සහ සේනාව රැගෙන එන ලෙස දන්වා සිටියේය. පසු දින විශාල පිරිසක් රාජාභිෂේකයට පැමිණ සිටියහ. උත්කර්ශවත් ලෙස මෙම උත්සවය පවත්වා ඇත. එහි දී විවිධ පළාත් සඳහා නිලධාරීන් පත්කර ඇත. ඒ අනුව ඌව පළාත (මොනරවිල කැප්පෙටිපොළ, දන්ගමුව රඹුක්පොත්, කැටකැල යන මොහොට්ටාලවරු) වලපනේ, (හැපත්ගමුවේ හා කිවුලේගෙදර මොහොට්ටාලවරු) සබරගමුව, (දෙමෝදර මොහොට්ටාලවරු) මාතලේ, (තිබ්බටුවැවේ අදිකාරම් හා එළදැත්තේ පුංචිරාළ) තුම්පනේ, (දේදුනුපිටියේ මොහොට්ටාල) යටිනුවර, (කෝණ්ඩුගහ කෝරාළ, දොඩම්ගල උන්ඩියේ රාළ, කිරිබත්කුඹුරේ ලියනරාළ) හාරිස්පත්තුව, (හරංකහවේ සහ

---

[46] එම.

මෝතොට කෝරාළවරු) දුම්බර, (ලියනරාළ ඇතුළු පිරිස) හේවාහැට, (කාලහෝදණ්ඩ කෝරාළ, කාලහෝදණ්ඩ මුදියන්සේ) උඩුනුවර (කැටකුඹුරේ හා මීවතැන්නේ නිළමේ) යන අය අයත් වූහ.

එපමණක් නොව ඒ ඒ දිසාව වෙනුවෙන් පෙනී සිටීමට ද විවිධ ප්‍රභූන් මඟුල් මඩුවට ඒකරාශී වී සිටියහ. ඔවුන් ලෙස හකුරුගම්මන නිළමේ, අතපත්තුවෙ ලේකම්, පහළවෙල නිළමේ, උනම්බුවේ බත්වඩන නිළමේ, මඩුගල්ලේ ගබඩාවේ නිළමේ, උනම්බුවේ බත්වඩන නිළමේ. මඩුගල්ලේ ගබඩාවේ නිළමේ, මීරගහවත්තේ නිළමේ, මැටිබෑයේ නිළමේ, උඩුනුවර වතුරුපොළ නිළමේ, කටුගම්පොළ මොහොට්ටාල හා ඉහගම උන්නාන්සේ ඒ අතර වූහ.[47] මෙම අභිෂේකය පිළිබඳ ආරංචිය ගම් නියම් ගම් පුරා පැතිර ගියේය. ඒමගින් සිංහලයාගේ ජාතික චින්තනය වර්ධනය විය. තව තවත් කැරලිකරුවෝ විරෝධාර ලෙස සටනට පෙළගැසුනහ. මෙම ආරංචිය පැතිරෙත්ම ඉංග්‍රීසීන් මහත් භීතියට සහ කලබලයට පත් විය. අභිෂේකය පවත්වා රජතුමා ඇතුළු පිරිස කොත්මලේ බලා පිටත් වූහ. තමන්ට රජෙක් සිටින බව හඳුනාගත් සිංහලයා අධිෂ්ඨානයෙන් කටයුතු කරන ලදී.

පැරණිමේ රාජ්‍ය පාලන ක්‍රමය යළි ස්ථාපිත කිරිමේ අරමුණින් සිංහලයා විසිරයත්ම ඒ බව දැනගත් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා දැඩිසේ නොසන්සුන් විය. ඒ සඳහා වහ වහා පියවර ගැනීම පිණිස කටයුතු කරන ලදී. හෙතෙම මහනුවර මඟුල් මඩුවට රදල නායකයින් කැඳවා ඔවුන්ට තර්ජනාත්මක ස්වරූපයෙන් ආමන්ත්‍රණය කර ඇත. සියලු රදලවරු ඊට සහය මෙම අරගලයට නොදී සිටිය යුතු බව පෙන්වා දුන්නේ ය. එවිට නිහඬව මුනිවත ආරක්ෂා කළ රදලවරු, මෙම කැරැල්ල පහත් පන්තිවල ක්‍රියාවකැයි පවසා, ජලයෙන් තනාගන්නා ලුණු ජලයෙන්ම දියව යන බව කියමින් මෙය ඉක්මනින් සන්සිඳී යන බව පෙන්වා දුන්නහ. නමුත් මෙම අදහස පිළිනොගත් ආණ්ඩුකාරතුමා සූදානමෙන් සිටින ලෙස සේනාංකවලට නියෝග දුන්නේ ය. ඉංග්‍රීසීන් කැරැල්ල මර්දනයට දැඩි ප්‍රතිපත්ති අනුගමනය කළේය. රාජාභිෂේකයෙන් පසු පිටත්ව ගිය සිංහල නායකයෝ සෑම ප්‍රදේශයක ම

[47] තල්වත්ත, 2009, 66 පිට.

දරුණු ලෙස සටන් ආරම්භ කළහ. කලින් වෙල්ලස්ස, ඌව සහ වලපනේට පමණක් සීමා වූ සිංහල විමුක්ති අරගලය මාතලේ, දුම්බර. උඩුනුවර, යටිනුවර, තුන්පනේ, හාරිස්පත්තුව යනාදී සෑම ප්‍රදේශයකම පැතිර ගියේය. කැරැල්ල මර්දනයට නම් කැරලි නායකයන් සිරභාරයට ගත යුතුය. 1817 නොවැම්බර් 06 වෙනිදා කැරලි නායකයෙකුගේ හිස ලබා දුන් කෙනෙකුට රික්ස් ඩොලර් 2000ක් ද කැරැල්ලට සම්බන්ධ දමිල ජාතිකයෙකු ගේ හෝ කිවුලේගෙදර මොහොට්ටාල හෝ බූටෑවේ රටේ රාළ වැන්නන්ගේ හිස් ගෙනත් දුන් විට රික්ස් ඩොලර් 500ක් දෙන බවට ද ඉංග්‍රීසි රජය ප්‍රකාශයට පත් කළේ ය.

රටේ වාතාවරණය දරුණු අතට පත්වීමත් සමඟ ආණ්ඩුකාරතුමා දෙබිඩි පිළිවෙතක් අනුගමනය කර ඇත. සිංහලයා නැසීමට සිංහලයාම යොදාගතයුතු බවට කල්පනා කළේ ය. හෙතෙම 1818 ජනවාරි නිවේදනයකින් කැප්පෙටිපොළ ඇතුළු නායකයින් දාහත් දෙනෙකු ඔවුන් දැරූ තනතුරුවලින් සහ දේපළවලින් නෙරපා දැම්මේ ය.[48] කැරලිකරුවන්ගේ සෑම උපක්‍රමයක්ම දේශීය ඔත්තුකරුවන් ලබාගත්තේ ය. ප්‍රධාන වශයෙන් වෙළඳුන් ලෙස බෝහෝ ප්‍රදේශවල සැරිසැරූ මුස්ලිම්වරු වාසි අපෙක්ෂාවෙන් ඉංග්‍රීසීන්ට තොරතුරු සැපයූහ. එනිසා කැරලිකරුවන්ගේ බොහෝ රහස්‍ය තොරතුරු අනාවරණය කර ගැනීමට හැකි විය. ඒවා මනාව අධ්‍යයනය කළ මැක්ඩොනල්ඩ් ඔවුන්ව මර්දනය කිරීමට දැඩිපිළිවෙතක් ගෙන ගියේය. ඌවේ කැරලිකරුවෝ කුසගින්න සහ වෙඩි උන්ඩයන් අතර සිර වූ ජීවිතයක් ගත කළහ. මෙම භයංකාර තත්ත්වයට මුහුණපෑ කැරලිකරුවෝ සිය නායකයින්ගේ අණට අකීකරුව සටන් බිමෙන් ඉවත් කිරීමට මැක්ඩොනල් පියවර ගන්නා ලදී. ඉන් නොනවතී ජනතාවගේ බඩට පහර දීමට ඉංග්‍රීසීන් පියවර ගත්තේ ය. සටන මැඩලීමට නම් ගම් බිම් විනාශ කිරීම අවශ්‍ය විය. මැක්ඩොනල් යටතේ ඌව ප්‍රදේශයට පැමිණි ඉංග්‍රීසි හේවායෝ සිංහලයා මරා දැමූහ. මෙම හේවායෝ ගොවිතැන් කිරීමට ජලය ලබාගත් වාරිමාර්ග විනාශ කර, අතිරේක ආහාර පාන සැපයූ ගහ කොළ කපා දැමූහ. අවසානයේ ජනතාව මහත් දුර්භික්ෂයකට මුහුණ පෑවේය. ආහාර ප්‍රශ්නය උග්‍ර වීමත් සමග

---

[48] ද සිල්වා, එම්. යූ. **ලංකාවේ ආණ්ඩු ක්‍රම සහ ජාතික ව්‍යාපාරය**, අභය මුද්‍රණ, කඩවත,1996, 83-84 පිටු.

කැරලිකරුවන්ගෙන් ආත්ම විශ්වාසය හීනව ලෙඩ දුකින් පෙළෙන්නට වූහ.[49] මෙය ඉංග්‍රීසීන්ගේ වාසියට හේතු විය.

මෙම අරගලය ක්‍රියාත්මක වීමේ දී හතර කෝරළේ, හත් කෝරළේ, දුම්බර සහ මාතලේ බ්‍රිතාන්‍යයන්ට විරුද්ධව බලසම්පන්න පෙරමුණු හතරක් යටතේ සංවිධානය විය. එය ශක්තිමත් පදනමක් මත සංවධානය විය. එනමුත් ඉංග්‍රීසීන් කපටි බුද්ධිය සහ කූට උපක්‍රම යොදා කැරලිකරුවන්ගේ ශක්තිය බෙලහීන කිරීමට පියවර ගත්තේ ය. මේනිසා යුද පෙරමුණේ විශාල පසුබැසීමක් ඇති විය. රොබට් බවුන්රිග් කෙසේ හෝ දළදා වහන්සේ ආපසු ලබාගැනීමට නැවත කල්පනා කළේය. එය කැරලිකරුවන්ගේ චිත්ත ධෛර්ය බිඳවැට්ටවීමට සෘජුව බලපාන බව ඉංග්‍රීසීන් හොඳින් දැන සිටියේය. කර්නල් හුක් හත් කෝරළය සහ තුම්පනේට ද මැක්ඩොනල්ඩ් වෙල්ලස්සට ද මේජර් හොක්ස්ට් දුම්බරට ද මේජර් ලීමන් රුවන්වැල්ලට ද කර්නල් හුක් සහ කපිතාන් හාඩි කුරුණෑගලට ද පිටත්ව ගියහ. සිත් පිත් නොමැතිව ලොකු පොඩි සැම විනාශ කිරීමට ඔවුහු කුරිරු වූහ. කන්ද උඩරට විනාශ කර අත්පත් කර ගැනීමේ මහා මොළකරුවූ ජෝන් ඩොයිලි සිංහලයාගේ චිත්ත ධෛර්ය බිඳවීමට කල්පනා කර ඇත. අරගලයේ රජු සැබෑ නායක්කාර් උරුමකරුවෙකු නොවන බව ජනතාව වෙත ප්‍රචාරය කරන ලදී. මේ සඳහා ඔහුට උපකාර කර ඇත්තේ උඩගම හිමියන් විසින් බවට සඳහන් වේ. එම පාවදීම අරගලයේ ගමන් මග වෙනස් කිරීමට සෘජුවම බලපෑවේ ය.

1818 අරගලය විධිමත් පදනමක් මත සංවිධානය වූවකි. ආරම්භයේ දී සීමිත පිරිසක් සිටිය ද පසුව එය පුළුල් ජන පදනමක් තුළ පැතිර ගියේය. සෑම යටත්විජිත සමාජයකම ඉංග්‍රීසීන් ගෙනගිය කූට උපක්‍රම මෙම අරගලය මර්දනය කිරීමට ද යොදා ගත්තේය. එදත් අදත් සිංහලයා තුළ පැවති අසමගිකම් නිසා පටු වාසි අපෙක්ෂාවෙන් අරගලය පවාදුනි. පරගැති ආකල්ප පෙරදැරිව ඉදිරියට ගිය අප ඉංග්‍රීසීන්ට ජයක්‍රහණය කිරීමට අවශ්‍ය වාතාවරණය නිර්මාණය කර දුන්නේ ය.

[1] තෙන්නකෝන්, 1962, 110-120 පිට.

[49] තෙන්නකෝන්, 1962, 110-120 පිට.